# කළමනාකරණ කමිටු රැස්වීම.

දිනය - 2017.01.16

වේලාව - ප.ව. 02.00

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)

මූලාසනය - එම්.ජී.බී. දයා සෙනරත් මයා (ප්‍රධාන ලේකම් - බ.ප.)

සහභාගී වූ නිලධාරීන්,

- **කේ.කේ.චම්පිකා කනේරු මිය**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)**
- **සිරිසෝම ලොකුවිතාන මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)**
- **එන්.බන්දුල ප්‍රේමකුමාර මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)**
- **ඩී.එම්.එන්. දිසානායක මිය.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)**
- **ඩබ්.එම්.ඩී.එන්. රණසිංහ මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)**
- **චම්පිකා පතිරණ මිය.**
  **අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන.**
- **ඩී.ජී.සුමනා දැදිගම මිය.**
  **නියෝජ්‍ය ආදායම් කොමසාරිස් (බ.ප)**
- **නිශාන්ති විජේසුන්දර.**
  **අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)**
- **සුනේත්‍රා පතිරත්න මිය.**
  **අධ්‍යක්ෂ (අයවැය)**
- **මහේෂ් විජේසේකර මයා.**
  **අධ්‍යක්ෂ (ගොඩනැගිලි)**
- **ජී.ඩබ්ලිව්.ප්‍රියදර්ශනී පෙරේරා මිය.**
  **අධ්‍යක්ෂ (ඉංජිනේරු)**
- **ආර්.ජී.ටී.ආර්.රාමනායක මිය.**
  **අධ්‍යක්ෂ (සැලසුම්)**

## සාකච්ඡා කරන ලද කරුණු

### පාලන අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම | තොරතුරු දැන ගැනීමේ පනතේ අරමුණු ප්‍රකාරව අදාළ කරුණු ඉතා ඉක්මනින් සොයා ගත හැකි වන පරිදි සරල ආකාරයේ සුචි සෑදීම සහ පෙබරවාරි මස 01 දින වන විට වෙබ් අඩවියට සියලු තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 02. | රියදුරු ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම | ඉංජිනේරු අංශයේ රියදුරන් නිදහස් කර යැවීම.<br>ගේට්ටු අවසර පත් ලබා නො දී බැහැරව යන වාහන පිළිබඳ ව රියදුරන්ගෙන් නිදහසට කරුණු විමසා යැවූ ලිපියට පිළිතුරු නො ලත් බැවින්, සිහි කැඳවීම් ලිපි යොමු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 03. | ශ්‍රාවස්ති පරිශ්‍රය සඳහා බෞද්ධ සංගමයක් පිහිටුවීම. | 2017 වර්ෂයේ ජාත්‍යන්තර වෙසක් උත්සවය ශ්‍රී ලංකාවේ පැවැත්වීමට සමගාමීව ප්‍රධාන ලේකම් කාර්යාලය තුල බෞද්ධ සංගමයක් ආරම්භ කිරීම හා මෙම මස 27 වන දින ප.ව.3.00ට ප්‍රධාන ලේකම් කාර්යාලයීය බෞද්ධ සංගමය පිහිටුවීම සඳහා නිලධාරීන් කැඳවීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 04. | ශ්‍රාවස්ති පරිශ්‍රයේ ආපන-ශාලාව සම්බන්ධව | ශ්‍රාවස්ති පරිශ්‍රයේ ආපනශාලාව පිළිබඳ පැමිණිලි ලැබෙන බැවින්, එම අඩුපාඩු ලිඛිත ව ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

### පිරිස් හා පුහුණු අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | 2017 වසර සඳහා ඵලදායිතා වැඩසටහන. | 2017 වසරේ ඵලදායිතා වැඩසටහන සඳහා කව නායකයින් පුහුණු කිරීමට කටයුතු කිරීම හා ඵලදායීතා ලේකම් කාර්යාලයේ නිලධාරීන් ඊළඟ කළමනාකරණ කමිටු රැස්වීම් දිනයේ දී කැඳවා වැඩිදුර සාකච්ඡා කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු). |

| | | | |
|---|---|---|---|
| 02. | පළාත් සභා නිලධාරීන්ගේ විනය කටයුතු නියාමනය කිරීම. | පළාත් සභා නිලධාරීන් වෙනුවෙන් විනය කටයුතු සම්බන්ධ පුහුණු වැඩසටහන මෙම මස 20, 21 හා 22 දින පැවැත්වීම සඳහා කටයුතු සූදානම් කර ඇත. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 03. | තොරතුරු තාක්ෂණ සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුර | ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය වෙනුවෙන් නව "සහකාර අධ්‍යක්ෂ" තනතුර සඳහා සුදුසු පුද්ගලයෙක් බඳවා ගැනීම සඳහා සේවා ව්‍යවස්ථාව සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

## <u>සැලසුම් අංශය</u>

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | සංවර්ධන යෝජනා සම්බන්ධ ප්‍රගතිය | 2017 වසරට අදාළ අනුමත කරන ලද සංවර්ධන යෝජනා සංඛ්‍යාව ආංශික වර්ගීකරණ මුදලත් සමඟ ජනවාරි 15 දින වන විට එවීමට කටයුතු කරන මෙන් දන්වා ලේකම්වරුන් වෙත ලිපි ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

## <u>ඉංජිනේරු අංශය</u>

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | පළාත් සභාවේ ලේඛන සංරක්ෂණය සහ ක්‍රමවත් කිරීම. | ලේඛන සංරක්ෂණය කිරීම සහ කාර්යයන් පහසු කිරීමේ වැඩසටහන් සැකසීමේ දී, පහත විශේෂ ක්‍රම අනුගමනය කිරීම.<br>• පෙබරවාරි 04 සිට ලේඛන පරිලෝකනය කිරීමේ (scanning) ක්‍රමවේදයක් සැකසීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) හා සියලු ම අංශ ප්‍රධානීන් |
| 02. | රාජකාරි කටයුතු සඳහා අන්තර්ජාලය භාවිතයේ දී ඇති වන දෝෂය | පසුගිය මාසය තුල සියලු නිලධාරීන් අන්තර්ජාලය භාවිතා කරන ලද ආකාරය පිළිබඳ වාර්තාවක් ලබා දෙන මෙන් බී.ඩී.පී.නිරන්ජන් මහතා වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 05. | වෙබ් පිටුව නිර්මාණය | මේ වන විට පළාත් සභාවේ සියලු අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු තම ආයතනයේ වෙබ්අඩවි සදා නිම කර සිටිය යුතු බැවින්, එම වෙබ්අඩවි නිරීක්ෂණය කිරීම සඳහා ඒවායෙහි වෙබ්-ලිපිනයන් විමසා ලිපි යොමු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |